
DP EDUCATION Coding School

ඩී පී එඩියුකේෂන් කෝඩින් පාසල
ඩිජිටල් වෙසක් කලාපය - 2026

# HTML, CSS සහ JavaScript භාවිතයෙන් වෙබ් පිටුවක සම්පූර්ණ ඩිජිටල් තොරණක් නිර්මාණය කරමු.



# Visual Studio හෝ VS Code මගින් ව්‍යාපෘතිය ආරම්භ කිරීම

**1. පරිගණකයේ ෆෝල්ඩරයක් (Folder) සාදා ගැනීම**

**ප්‍රොජෙක්ට් එකේ සියලුම ෆයිල්ස් එකම තැනක තබා ගැනීමට මෙය වැදගත් වේ.**

**a. පළමුව ඔබේ පරිගණකයේ සුදුසු තැනක (Desktop හෝ Documents) රයිට් ක්ලික් (Right Click) කරන්න.**

**b. එහි ඇති New වෙත ගොස් Folder යන්න තෝරන්න.**

**c. එම ෆෝල්ඩරයට ඔබේ ව්‍යාපෘතියට අදාළ නමක් දෙන්න (උදා: Thorana_Project).**

**2. VS Code හෝ Visual Studio මගින් එම ෆෝල්ඩරය විවෘත කිරීම (Open Folder)**

ඔබ තෝරාගන්නා මෘදුකාංගය අනුව මෙය ක්‍රම දෙකකට කළ හැකියි.

**1. VS Code (Visual Studio Code) භාවිතා කරන්නේ නම්:**

1. VS Code මෘදුකාංගය විවෘත කරන්න.
2. ඉහළ වම් කෙළවරේ ඇති **File** මෙනු එකට ගොස් **Open Folder** යන්න ක්ලික් කරන්න.
3. ඔබ කලින් සෑදූ ෆෝල්ඩරය තෝරා **Select Folder** යන්න ක්ලික් කරන්න.

**2. Visual Studio (IDE) භාවිතා කරන්නේ නම්:**

1. Visual Studio විවෘත කරන්න.
2. ආරම්භයේදීම ලැබෙන Window එකේ ඇති **Open a local folder** යන්න ක්ලික් කරන්න.
3. එමගින් ඔබ සෑදූ ෆෝල්ඩරය තෝරා දෙන්න.

Visual Studio

VS Code

## භාවිතා වන තාක්ෂණයන් - Software tools & Technology Stack

- **Visual Studio හෝ VS Code**

- **HTML5 -** තොරණේ සැකස්ම (Structure) සඳහා.

- **CSS3 -** ස්ථානගත කිරීම් (Positioning) සහ ආලෝකකරණය (Styling) සඳහා.

- **JavaScript -** අන්තර්ක්‍රියාකාරීත්වය (Interactivity) සහ පිටු අතර ගමනාගමනය සඳහා.

## Folder Structure (ගොනු පද්ධතිය)

සාර්ථක Coding ව්‍යාපෘතියක පදනම වන්නේ පිළිවෙළකට සකස් කළ Folder පද්ධතියයි.

**Root Folder:** Thorana_Project/

index.html : ප්‍රධාන අතුරුමුහුණත.


style.css : සියලුම හැඩගැන්වීම් ගොනුව.

script.js : ක්‍රියාකාරීත්වය පාලනය කරන ගොනුව.

images/ : තොරණේ රූප සහ Light GIFs.

audio/ : ජාතක කතා හඬපට.

frames/ : එක් එක් කතා පුවතට අදාළ HTML පිටු.





* ඉහත ආකාරයට ගොනු පද්ධතිය සකස් කරගන්න


## Folders තුල අවශ්‍ය Files ඇතුලත් කිරීම

අවශ්‍යය සියලුම images (png & gif), audio files (mp3) ප්‍රධාන ගොනුවෙන් Download කරගන්න


Image folder





Audio Folder




Frames Folder



# HTML ගොනුවෙහි මූලික සැකැස්ම




## <head> කොටස (පසුබිම් සැකසුම්)

- **<html>**
  මුළු HTML කේතයම ආරම්භ වන්නේ සහ අවසන් වන්නේ මෙම ටැගය (Tag) තුළයි. මෙය වෙබ් පිටුවේ මූලික පදනමයි.

- **<title>...</title>**
  බ්‍රවුසරයේ ඉහළ ටැබ් එකේ පෙනෙන නම "කෝඩින් වෙසක් කලාපය 2026" ලෙස මෙයින් සකසයි.

- **<link rel="stylesheet" href="style.css">**
  වෙබ් පිටුව හැඩගැන්වීමට අවශ්‍ය CSS කේත ඇතුළත් style.css ගොනුව මෙයට සම්බන්ධ කරයි.

- **<body> කොටස (දෘශ්‍යමාන කොටස)**
  වෙබ් පිටුවට පිවිසෙන්නෙකුට පෙනෙන දේවල් මෙහි ඇතුළත් වේ.


## HTML Architecture (ස්ථර සැකස්ම)

තොරණේ සෑම රූපයක්ම සහ එයට අදාළ ආලෝක ධාරාව (Light) එක් 'Layer' එකක් තුළ තැබීම මෙහි මූලික තාක්ෂණයයි.

### Example for Frame 1

```
<div class="layer">
    <img class="light1" src="images/light1.gif">
    <img class="image1 clickable" src="images/image1.png" data-frame="1">
    <button class="frame-button button-1">1</button>
</div>
```

මෙහි div class="layer" යනු රූපය සහ ආලෝකය රඳවා ගන්නා පෙට්ටියයි. light1.gif මගින් පසුබිමේ දැල්වෙන ආලෝකයත්, image1.png මගින් ප්‍රධාන කතා පුවතේ රූපයත් දිස්වේ.




රූප 9 (light images , frame images) සඳහාම මෙම ආකෘතියම භාවිතා වන අතර, එහි අංක පමණක් (1 සිට 9 දක්වා) වෙනස් කළ යුතුය.

### සම්පූර්ණ HTML කෝඩ් එක මෙම ගොනුවෙන් අධ්‍යයනය කරන්න

index.html

## CSS Mastery (ස්ථානගත කිරීම සහ සජීවීකරණය)

Absolute Positioning තාක්ෂණය භාවිතයෙන් තොරණක හැඩයට රූප රවුමට පෙළගැස්වීම මෙහිදී සිදු කෙරේ.

```css
CSS

/* රූපය සහ ආලෝකය එක මත එක තැබීම */
.image1 {
  position: absolute;
  top: 575px; left: 250px; /* ස්ථානය තීරණය කිරීම */
  border-radius: 50%;
  transition: 0.3s; /* සජීවීකරණය සඳහා */
}

/* මවුසය රූපය මතට ගෙන යන විට විශාල වීම */
.image1:hover {
  transform: scale(1.05);
}
```

* අනෙකුත් රූප සඳහාද top සහ left අගයන් වෙනස් කරමින් අදාළ ස්ථාන වල රූප පිහිටුවිය හැක.

සම්පූර්ණ CSS කෝඩ් එක මෙම ගොනුවෙන් අධ්‍යයනය කරන්න

style.css

## JavaScript Logic (ක්ලික් කිරීමේ ක්‍රියාකාරීත්වය)

පරිශීලකයා රූපයක් ක්ලික් කළ විට එය නිවැරදි කතා පුවතට (Frame) යොමු කිරීම JavaScript මගින් සිදු වේ.

```
document.querySelectorAll('.clickable').forEach(item => {
    item.addEventListener('click', () => {
        const frameNum = item.getAttribute('data-frame');
        window.location.href = `frames/frame${frameNum}.html`;
    });
});
```

*මෙහිදී සියලුම රූප සඳහා පොදු EventListener එකක් භාවිතා කිරීමෙන් කේතය (Code) කෙටි කර ඇත.

සම්පූර්ණ Java Script කෝඩ් එක මෙම ගොනුවෙන් අධ්‍යයනය කරන්න



script.js

## Audio & Final Touch (අවසන් නිමාව)

සෑම උප-පිටුවකම (Frame page) අදාළ කතාවට ගැලපෙන හඬපටයක් ස්වයංක්‍රීයව වාදනය වන ලෙස සකසා ඇත

```
<audio controls autoplay>
    <source src="../audio/jathaka_audio.mp3" type="audio/mp3">
</audio>
```

මෙමගින් ශ්‍රව්‍ය සහ දෘශ්‍ය යන අංශ දෙකෙන්ම පරිපූර්ණ ඩිජිටල් අත්දැකීමක් පරිශීලකයාට හිමිවේ.

සම්පූර්ණ කෝඩ් එක මෙම ගොනුවෙන් අධ්‍යයනය කරන්න

Digital Thorana.zip